# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,472 - 2026 ජනවාරි මස 16 වැනි සිකුරාදා - 2026.01.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | 96 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 100 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |



**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 23 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් සභා නිවේදන

**පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - වයඹ පළාත**

රජයේ ඉඩම් ආඥාපනත යටතේ කුරුණෑගල හා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට අංක 510 මැදගෙදර ග්‍රාම නිලධාරි වසමෙන් ඉඩම් බෙදාදීම සඳහා තෝරාගනු ලැබීම සඳහා වූ නිවේදනයයි

01. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2026.02.16 දින ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (a) | ඉඩමේ නම | - | ගොපරලගේදළුපොත |
| (b) | ඉඩම් මැනුම් විස්තරය | - | අ.ග.පි. 1157 හා කැබලි අංක 189 |
| (c) | ඉඩම පිහිටි ගම | - | ඉහල වල්පොල |
| (d) | ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස | - | 510 මැදගෙදර |
| (e) | උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය | - | ඉබ්බාගමුව |
| (f) | දිස්ත්‍රික්කය | - | කුරුණෑගල |
| (g) | අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය | - | ගොඩ ඉඩම |
| (h) | අන්සතු කරනු ලබන ඒකකය | - | පර්චස් 20 |

02. කුරුණෑගල හා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි 2008/4 චක්‍රලේඛය යටතේ ලියාපදිංචි වී ඇති පහත දැක්වෙන පංතියට හෝ පන්තිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

i. ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධිත වූවන්,
ii ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ සිට ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් වූවන්ගේ,

(a) විවාහක නම් කලත්‍රයා හෝ අවිවාහක දරුවන්,
(b) අවිවාහක නම් මව හෝ පියා.

ඉහත සඳහන් පන්තියට හෝ පන්තිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

03. සියලු ඉල්ලුම්පත්‍ර 2026.02.06 දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

04. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2026.02.16 දින ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක් ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ *නැතහොත්* තමා නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලු සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

06. තෝරා ගනු ලබන සෑම අයදුම්කරුවෙකු සඳහා ම ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2021/01 චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලබන අතර සුදුසුකම් ලබන පුදගලයන් එහි කොන්දේසිවලට යටත්විය යුතුය.

07. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබාගත හැක.

i. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල.
ii. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව.

iii. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුණෑගල.
iv. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මල්ලවපිටිය.

පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2026 ජනවාරි මස 05 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ හා දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ කුරුණෑගල හා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි, ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට අංක 510 - මැදගෙදර ග්‍රාම නිලධාරි වසමෙන් ඉඩම් බෙදා දීම සඳහා තෝරාගනු ලැබීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

01. සම්පූර්ණ නම :.................................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................................................................................

03. (i) ලිපිනය :..........................................................................................................................................
(ii) ඡන්ද බලය ලබාගෙන ඇති මැතිවරණ කොට්ඨාසය :......................................................................
(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.................................................................................................

04. ගෘහ මූලික අංකය :................................................................................................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :................................................................................................................................

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :...................................................................................................

07. උපන් දිනය :...............................................................................

08. විවාහක/අවිවාහක බව :........................................................................

09. රැකියාව :...........................................................................................

10. රැකියාව කරන ස්ථානය :..............................................................................................

11. රණවිරුවා පිළිබඳ තොරතුරු (තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුයි) :

(i) විශ්‍රාමික නම් විශ්‍රාම ගිය දිනය :...............................................................................
(ii) ආබාධිත අයෙකු නම් ආබාධිත තත්ත්වය :.........................................................................
(iii) මියගිය අයෙකු නම් මිය ගිය දිනය හා මරණයට හේතුව :....................................................

12. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| අනු අංකය | නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

13. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම් පිළිබඳ විස්තර :

| අනු අංකය | ඉඩමේ නම | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි.)

14. කලත්‍රයාගේ (පුරුෂයාගේ හෝ භාර්යාවගේ) රාජකාරි ලිපිනය :...........................................................................................

15. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය (තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග) :.............................................................

16. නිවස පිහිටි ස්ථානය :..................................................................................................................................................

17. යැපෙන දරුවන්ගේ විස්තර :..........................................................................................................................................

18. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

19. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න.

1. ලබාගත් ණය මුදල :
2. ණය ලබාගත් ආයතනය :
3. දැනට ගෙවීමට ඇති ශේෂය :

20. අයදුම්කරු හා පවුල් ඒකකය සතු ඉඩම් පිළිබඳ විස්තර.-

| ඉඩම පිහිටි ග්‍රාම නිලධාරි වසම | ඔප්පු/බලපත්‍ර අංකය | ඉඩමේ ප්‍රමාණය |
|---|---|---|
| | | |
| | | |
| | | |

21. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟවන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාලසීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද, අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 21 දක්වා ප්‍රකාශකර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද, මෙයින් සහතික කරමි.

..............................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :...........................................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................

අනු අත්සන් කරමි.

..............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශයයි**

.......................................දිස්ත්‍රික්කයේ ...................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................................ ග්‍රාම නිලධාරි වසමේ .............................................................................................. පදිංචි ............................................................ වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මගේ භාර්යාවට සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර පනහකට (50) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක්කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ...................... රූඩ් .................... පර්චස්...................... පමණ වූ මෙම ඉඩම පවරා ගැනීමේ/මිලදී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන්කර ඇති අක්කර පනහේ සීමාව නොඉක්මවන බවත්, නිවාස දේපළ උපරිම පනත යටතේ සීමාවන් නොඉක්මවන බවටත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

..........................................,
දිවුරුම්කරු.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ දී අත්සන් තැබූ බව සහතික කරමි.

...............................................,
සාමදාන විනිශ්චයකාර තැන.

01-225

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

අංක 2,469 හා 2025.12.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළාත් සභා කොටසේ පළ කර තිබූ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.01.30** දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. තව ද, එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කාරුණිකව දැනුම් දෙමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

01-181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.